**12 ශ්‍රේණිය ආර්ථික විද්‍යාව 8 වන සතිය - ජූනි 22 සිට 26 දක්වා**

## නිපුණතා මට්ටම 1.3 - නිෂ්පාදන සාධකවල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත්වල ඵලදායීතාව තීරණය කරන සාධක විග්‍රහ කරයි.

- නිෂ්පාදන බිහි කර ගැනීම සඳහා යොදා ගනු ලබන භූමිය,ශ්‍රමය,ප්‍රාග්ධනය සහ ව්‍යවසායකත්වය නිෂ්පාදන සාධක ලෙස හැඳින්වේ.
- භූමිය හා ප්‍රාග්ධනය දේපළ සම්පත් වශයෙන් ද ශ්‍රමය හා ව්‍යවසායකත්වය මානව සම්පත් වශයෙන් ද වර්ග කළ හැකිය.

- **භූමිය -**

  ස්වභාවධර්මය දායාද කොට ඇති ඵලදායිතාවෙන් යුක්ත ව නිෂ්පාදනයට යොදා ගත හැකි ස්වභාවික සම්පත් භූමිය ලෙස හැඳින්වේ.

- **ශ්‍රමය -**

  භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදා ගන්නා කායික හා මානසික වෙහෙස ශ්‍රමය ලෙස හඳුන්වයි.

- **ප්‍රාග්ධනය -**

  භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියට මිනිසා විසින් නිර්මාණය කරන ලද ආධාරක ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.

- **ව්‍යවසායකත්වය -**

  කිසියම් ආර්ථිකයක් තුළ විසිරී පවතින නිෂ්පාදන සාධක ඒකරාශි කරමින් නිෂ්පාදන කටයුතු සංවිධානය කිරීම,මෙහෙයවීම සහ අවදානම් දරමින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ව්‍යවසායකත්වයයි.

  ඵලදායිතාව - යෙදවුම් ඒකකයකින් ලබා ගන්නා සාමාන්‍ය නිමැවුම ඵලදායිතාව ලෙස හැඳින්වේ.

$$\text{සාධක ඵලදායිතාව} = \frac{\text{නිමැවුම් ප්‍රමාණය}}{\text{යෙදවුම් ප්‍රමාණය}}$$

**අභ්‍යාස**

1.භූමිය,ශ්‍රමය,ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වයේ ලක්ෂණ 5 බැගින් ලියන්න.
2.ඵලදායිතාව තීරණය කරන සාධක නම් කරන්න.